# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2024/3 - 2017 ජූනි මස 19 වැනි සඳුදා - 2017.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 2/2013

**1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත**

14අ වගන්තිය යටතේ වූ නියමය

1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 14අ වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු විෂයය භාර අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මේ නියමය මගින් ඉහත කී පනතේ 14අ වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ අයකරනු ලබන සෙස් බද්දේ අනුපාතයන් මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ නිශ්චිතව දක්වමි.

පනවනු ලබන සහ අයකරනු ලබන සෙස් අනුපාතයන්ට අදාළව අංක 1680/26 සහ 2010 නොවැම්බර් මස 19 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රසිද්ධියට පත් කරන ලද නියමය මින් පරිච්ඡින්න කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,<br>ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු<br>විෂයය භාර අමාත්‍ය.

2017 ජූනි මස 14 වැනි දින,<br>කොළඹ දී ය.


1A - G 25744 — 12 (2017/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| අයිතමය | සුරැකුම | අනුපාතය |
|---|---|---|
| (1) | ලැයිස්තුගත කොටස්වලට අදාළ වන අනුපාතය -<br><br>(i) පළමු රුපියල් මිලියන 100 දක්වා එම රුපියල් මිලියන 100 ද ඇතුළු ගනුදෙනු වටිනාකමට<br>(යම් තැනැත්තකු විසින් එකම දිනය තුළ එකම සුරැකුම්පතෙහි ගනුදෙනු කරනු ලැබූ මුලු වටිනාකම) | 0.072% |
| | (ii) ඉන්පසු පළමු රුපියල් මිලියන සියයට වැඩි ගනුදෙනු වටිනාකමට<br>(යම් තැනැත්තකු විසින් එකම දිනය තුළ එකම සුරැකුම්පතෙහි ගනුදෙනු කරනු ලැබූ මුලු වටිනාකම) | 0.045% |
| (2) | සාංගමික ණය සුරැකුම්පත්වලට (ලැයිස්තුගත පොදු සමාගම්වල ලැයිස්තුගත ණයකර සහ ලැයිස්තුගත නොකළ ණයකර) අදළවන අනුපාතය<br>(යම් තැනැත්තකු විසින් එකම දිනය තුළ එකම සුරැකුම්පතෙහි ගනුදෙනු කරනු ලැබූ මුලු වටිනාකම) | හුවමාරු මුලු වටිනාකම x 0.02% 3න් බෙදන්න |
| (3) | ලැයිස්තුගත ඒකක භාරවල ඒකක සඳහා අදළවන අනුපාතය<br>(යම් තැනැත්තකු විසින් එකම දිනය තුළ එකම සුරැකුම්පතෙහි ගනුදෙනු කරනු ලැබූ මුලු වටිනාකම) | ගනුදෙනු වටිනාකමින් 0.02% |

07 - 46

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.